අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020

General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

බෞද්ධ ශිෂ්ටාචාරය II
Buddhist Civilization II

45 | S | II

කාලය : පැය තුනයි
Time : Three hours

**1 කොටසින් ප්‍රශ්න දෙකක් ද 11 කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## 1 කොටස

**මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

01.

I. වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම නම් කරන්න.
II. චතුර්වර්ණයේ ඓතිහාසික ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ගෙන හැර දක්වන්න.
III. බෞද්ධ ඉගැන්වීම් මඟින් කාන්තාව මවක් ලෙස අගය කළ ආකාරය ප්‍රකට කරන්න.
IV. මක්කලී ගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.
V. බුද්ධ කාලීන භාරතයේ සොළොස් මහ ජනපද අතර පැවැති රාජාණ්ඩු පැහැදිලි කරන්න.

(4x5=20)

02.

I. බුදුරාජාණන් වහන්සේ "සත්ථා දේව මනුස්සානං" යනුවෙන් හඳුවන්නේ කවර හෙයින් දැයි පැහැදිලි කරන්න.
II. බුද්ධ චරිතයෙන් ප්‍රකට වන නායකත්ව ලක්ෂණ නිදසුන් දෙකක් මඟින් පෙන්වා දෙන්න.
III. බුදුරදුන්ගේ පත්මාකාර ජීවිතයෙන් වත්මන් සමාජයට ලබා ගත හැකි ආදර්ශයන් ලුහුඬින් දක්වන්න.
IV. බුදුරාජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීම් දෙකක් ගෙන හැර දක්වන්න.
V. ආනන්ද මහරහතන් වහන්සේගේ චරිතයේ පැවැති විශිෂ්ට චරිත ලක්ෂණ මොනවාද ?

(4x5=20)

03.

I. සදිසා නම් කරන්න.
II. ස්වාමි සේවක යුතුකම් ගෙනහැර දක්වන්න.
III. පුද්ගල පිරිහීමට හේතුවන කරුණු 05 ක් දක්වන්න.
IV. එම කරුණු දෙකකින් පුද්ගල පිරිහීම් සිදුවන අයුරු පැහැදිලි කරන්න.
V. රහමෙර පානයෙන් සිදුවන හානි 06 ක් දක්වන්න.

(4x5=20)

**11 කොටස**

**ප්‍රශ්න තුනක් තෝරාගෙන පිළිතුරු ලියන්න.**

04.

I. දසපින් කිරියවත් පුද්ගලයාගේ හා සමාජයේ යහපතට හේතුවන අයුරු පෙන්වා දෙන්න.

II. පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වර්තමාන පාරිසරික ගැටලු අවම කර ගැනීමට උපයෝගී කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(10x2=20)

05.

I. පුද්ගලයෙකුට යහපත් ආර්ථික පසුබිමක් ඇති කර ගැනීම සඳහා උපයුක්ත වන බෞද්ධ උපදේශ විස්තර කරන්න.

II. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී ධාර්මිකවීම සමාජ සුභසිද්ධිය සඳහා බෙහෙවින් ඉවහල්වන ආකාරය බෞද්ධ ඉගැන්වීම් අනුව පෙන්වා දෙන්න.

(10x2=20)

06.

I. බුදු සමයේ චිරස්ථිතිය හා ව්‍යාප්තිය පිණිස අශෝක අධිරාජයාගෙන් සිදු වූ මෙහෙය අගය කරන්න.

II. නාලන්දා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන හා පරිපාලන ක්‍රියාවලිය පිළිබඳ විවරණය කරන්න.

(10x2=20)

07.

I. ප්‍රාග්බෞද්ධ ලක්දිව පැවැති ඇදහිලි හා විශ්වාස ගෙනහැර දක්වා, මහින්දාගමනයත් සමඟ ඒවා බුදු සමයට අනුව හැඩ ගැසුණු ආකාරය පැහැදිලි කරන්න.

II. මහින්දාගමනයෙන් ශ්‍රී ලංකාවේ ආගමික, සංස්කෘතික හා ආර්ථික ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් පෙන්වා දෙන්න.

(10x2=20)

08.

I. තායිලන්තයට බුදුදහම ලැබුණු අයුරු ගෙහැනර දක්වා, තායි සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු පෙන්වා දෙන්න.

II. ජපානයේ බුදු සමයේ ව්‍යාප්තිය සඳහා ෂොතොකු තෛෂි විසින් ඉටු කරන ලද මෙහෙය ඇගයීමට ලක්කරන්න.

(10x2=20)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020

# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

බෞද්ධ ශිෂ්ටාචාරය I
Buddhist Civilization I

45 S I

කාලය : පැය දෙකයි
Time : Two hours

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 ලොව සියල්ල මැවූ මහා බ්‍රහ්මයා හෙවත් " පරමාත්ම" මවන ලද සත්වයා හට අත්මය ප්‍රදානය කළ හෙයින් ඔහුව සතුටු කිරීම සඳහා පුදපූජා හා යාග කළ අතර, එහි අරමුණ වූයේ මහා බ්‍රහ්මයා හා එක්වීමයි. එය

I. නිර්මාණ වාදයයි
II. දේවවරම්වාදයයි
III. බ්‍රහ්ම සවභ්‍යතාවයයි
IV. ඊශ්වර නිර්මාණවාදයයි
V. ආගමික සංස්කාරයයි

02.චතුර් වර්ණ්‍යාංමයා සෘෂ්ටං ගුණකර්ම විභාගශ: මා විසින් ගුණ කර්ම වශයෙන් වර්ණ හතරක් මවන ලදි.මේ අයුරින් සඳහන් වන්නේ.

I. මනුෂ්මෘතියේ
II. භගවත්ගීතාවේ
III. බ්‍රහ්මජාල සූත්‍රයේ
IV. ඍග්වේදයේ
V. යජුර්වේදයේ

03.ගායත්‍රී ශ්ලෝක ගායනා කොට පූනනූල කර පළඳා උපනයන මංගල්‍යයෙන් ආරම්භ කරන්නේ.

I. විවාහයයි
II. උපනයනයයි
III. ඉගෙනීමයි
IV. මරණයයි
V. කෙස්කැපීමයි

04.විවිධ කාල වකවානුවල දී සමාජයේ සිදුවන විවිධ පෙරළි අනුව යෝන, කාම්භෝජ ජනපදවල ස්වාමි, දාස කුල දෙක පමණක් වූ අතර ස්වාමිව සිටි අය කලක දී දාස වන බවත් දාසව සිටි අය ස්වාමි වන බවත් පෙන්වා දුන්නේ.

I. වාසෙට්ඨ සූත්‍රයේ - ජීව විද්‍යාත්මක සාධකයෙන්
II. වසල සූත්‍රයේ ආචාර විද්‍යාත්මක සාධකයෙන්
III. අස්සලායන සූත්‍රයේ ඓතිහාසික සාධකයෙන්
IV. මධුර සූත්‍රයේ ජීව විද්‍යාත්මක සාධකයෙන්
V. අස්සලායන සූත්‍රයේ සමාජ විද්‍යාත්මක සාධකයෙන්

05.යමෙකුට  තරුණ කාලයේ හෝ මහලු කාලයේ හෝ ශාසනික බ්‍රහ්ම චරියාවේ යෙදීමට හැකිබව පෙන්වා දෙමින් බුදු දහමේ විචාරයට ලක්වූයේ බ්‍රාහ්මණයන්ගේ

I. වර්ණධර්ම සංකල්පයයි.
II. ආපද්ධර්ම සංකල්පයයි
III. ස්වධර්ම සංකල්පයයි.
IV. නිර්මාණවාදි සංකල්පයයි
V. ආශ්‍රමධර්ම සංකල්පයයි

06.“ඉත්ථිපි ඒකච්ඡියා - සෙයෝාපෝස ජනාධිප” නුවණැති,සිල්වත් කුලදෙටුවන් පුදන යහපත් බිරිඳකට ලැබෙන පින්වත් කුමරුන් රජ කමට පවා සුදුසුවන බව බුදුරදුන් දේශනා කළේ.

I. සුදොවුන් රජුට
II. විශාඛාවට
III. අනේපිඬු සිටුතුමාට
IV. කොසොල් රජුට
V. බිම්බිසාර රජුට

07 .සත්වයා ශුද්ධියට අශුද්ධියට පත්වීමට හේතු ප්‍රත්‍ය බල නොපාන අතර, එය සිදුවන්නේ කිසියම් වු නියමයකට අනුවය.තමාගේ හෝ අන්‍යයන්ට වැඩ පිණිස  කළයුතු දෙයක් නැත.සියලු සත්වයෝ ,භූතයෝ ජීවයෙන්, බලයෙන්, වීර්යයෙන් තොරයයි ප්‍රකාශ කළේ.

I. මක්ඛලි ගෝසාල
II. පූර්ණ කාශ්‍යප
III. සංජය බෙල්ලට්ඨි පුත්ත
IV. අජිතකේශකම්බල
V. පකුධකච්චායන

08. ක්‍රි.පු. 6වන සියවස වන විට භාරතයේ ජනපද 16 ක් විය. මේ රාජ්‍යයන් අතර පවා නිතර සටන් ඇති විය. බලවත් රජවරු තම අවට රාජධානි තම ග්‍රහණයට ගැනීමට මාන බැලූහ.එසේ බලවත් භාවයට පත්ව තිබූ මහා රාජධානීන් 04 වන්නේ,

I. කෝසල, වජ්ජි, මල්ල, චේති රාජධානීන්
II. මගධ, වත්ස, කෝසල, අවන්ති රාජධානීන්
III. අවන්ති, කෝසල, අංග, මගධ රාජධානීන්
IV. ගාන්ධාර, වත්ස, අවන්ති, කුරු රාජධානීන්
V. මගධ, කෝසල, වත්ස. මල්ල රාජධානීන්

09.  ඊශ්වර නිර්මාණවාදි බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අනුව මහා බ්‍රහ්මයාගේ මැවීම චතුර්වර්ණයන් ගෙන් එකකින් සිදුවී ඇත. එයින් කියැවෙන්නේ ආරම්භයේ දී ම පුද්ගල ප්‍ර භේදයක් දැකිය හැකි වූ බවයි. මෙම අදහස ප්‍රතික්ෂේප කරන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,

I. වසල සූත්‍රය
II. පරාභව සූත්‍රය
III. මධුර සූත්‍රය
IV. අග්ගඤ්ඤ සූත්‍රය
V. අම්බට්ඨ සූත්‍රය

10. කාන්තාව බ්‍රාහ්මණ සමාජය තුළ අතිශයින්ම ඛේදනීය තත්ත්වයකට පත්විය. පිරිමි දරුවන් අපේක්ෂාවෙන් යාගහෝම පවා පවත්වා ඇත. ඒ අනුව පිරිමි දරුවන් අපේක්ෂාවෙන් හින්දු භක්තිකයන් කරන (පූජාව ) යාගය ,

I. බිලි පූජාව
II. අග්නි පූජාව
III. පුරුෂමේද යාග
IV. ශ්‍රාද්ධ පූජාව
V. පුංසවතය

11. දුප්පතුන්ට ධනය නොලැබීම නිසා ක්‍රමයෙන් දස අකුසලයම සමාජගත විය. මේ බව සඳහන් වන්නේ,

I. මංගල සූත්‍රයේ
II. චක්කවත්ති සීහනාද සූත්‍රයේ
III. පරාභව සූත්‍රයේ
IV. වාසෙට්ඨි සූත්‍රයේ
V. වසල සූත්‍රයේ

12. දස පුණ්‍ය ක්‍රියාවෙහි " අපචායන" යනුවෙන් හඳුන්වන්නේ ,

I. වතාවත් කිරීමයි
II. පිං අනුමෝදන් කිරීමයි
III. පිදිය යුත්තන් පිදීමයි
IV. බණ කීමයි
V. භාවනා කිරීමයි

13. ලෝකයට ඉතාම පරිපූර්ණ ආචාර ධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. මෙම ප්‍රකාශය කළ නූතන චින්තකයා ,

I. ලක්ෂ්මිනරසු
II. රට්ඨපාල
III. බර්ට්‍රන් රසල්
IV. මැක්ස්මුලර්
V. සොණ්ඩර්ස්

14. සූකරකත ලෙනේ දී බුදුරදුන් දීඝනඛ පරිබ්‍රාජකයාට දේශනා කළ වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත් වූයේ,

I. ආනන්ද තෙරුණ් වහන්සේ
II. සැරියුත් තෙරුණ් වහන්සේ
III. මුගලන් තෙරණ් වහන්සේ
IV. මහාකාශ්‍යප තෙරුණ් වහන්සේ
V. යස තෙරුණ් වහන්සේ

15. සම්පසාදනීය සූත්‍රය දේශනා කිරීමෙන් බුදුරදුන්ගේ පැසසුමට ලක්වූයේ ,

I. මුගලන් හිමි
II. සැරියුත් හිමි
III. ආනන්ද හිමි
IV. මහාකාශ්‍යප හිමි
V. අනුරුද්ධ හිමි

16. රූපාවචර ධ්‍යාන හතරම ලබාගෙන ධර්ම කථික භික්ෂූන් අතර අගතනතුර ලබාගත් අනාගාමී උපාසකතුමා ,

I. චිත්ත ගහපති
II. මිගාර සිටුතුමා
III. ධනංජය සිටුතුමා
IV. කොසොල් රජතුමා
V. අනේපිඩුසිටුතුමා

17. තමාට තමා හැර වෙනත් ස්වාමියෙකු හෝ තමා පාලනය කරන අදෘශ්‍යමාන බලයක් හෝ නොපෙනෙන බව,

I. ස්වච්ඡන්දතාවයයි
II. ස්වාධීනත්වයයි
III. ස්වවෛරීබවයි
IV. ස්වාමීත්වයයි
V. ස්වේච්ඡාවයි

18. පුද්ගල ස්වාධීනත්වයට, ස්වාමීත්වයට, ස්වච්ඡන්දතායට හා වගකීමට හානී සිදුවන ඉගැන්වීමක් නොවන්නේ,

I. ඊශ්වර නිර්මාණවාදය
II. පුබ්බේකතහේතු වාදය
III. නියති වාදය
IV. හේතුඵල වාදය
V. අහේතුඅප්පච්චයවාදය

19. සමාජ ප්‍රභවය හා විකාශනය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් අනුව ලොව පළමුවෙන්ම බිහිවූ වර්ණය (කුලය) වන්නේ,

I. බ්‍රාහ්මණ වර්ණය
II. ක්ෂත්‍රිය වර්ණය
III. වෛශ්‍ය වර්ණය
IV. ශුද්‍ර වර්ණය
V. ආර්ය වර්ණය

20. යහපත් රාජ්‍ය පාලන ධර්මයක් වන දස රාජ ධර්මය පිළිබඳව සඳහන් වන්නේ,

I. දීඝ නිකායේ
II. මජ්ජිම නිකායේ
III. සංයුක්ත නිකායේ
IV. ජාතක කථා සාහිත්‍යයේ
V. ඛුද්දක නිකායේ

21. " අම්භාකං සාලිනං භාගං අනුප්පදස්සාවි" යනුවෙන් අදහස් වන්නේ

I. ජනතාව නිසි පරිදි පන්සිල් රැකිය යුතු බවයි.
II. රජතුමා නිසි පරිදි පන්සිල් රැකිය යුතු බවයි.
III. ජනතාව නිසි පරිදි බදු ගෙවිය යුතු බවයි
IV. රජතුමා නිසි පරිදි බදු ගෙවිය යුතු බවයි
V. වෛශ්‍යයන් නිසි පරිදි බදු ගෙවිය යුතු බවයි

22. සිවුබඹ විහරණ සීමාවකින් තොරව වැඩිය යුතු බැවින් ,

I. අප්පමාද වේ
II. අප්පමඤ්ඤා වේ
III. සන්තුට්ඨීව වේ
IV. සුභර වේ
V. අප්පකිච්ඡ වේ

23. '' පාණඝාත පරද්ධබ්බං - පරංච කායතෝ ......'' යනුවෙන් දැක්වෙන්නේ

I. දසපුණ්‍යක්‍රියා
II. දසරාජධර්ම
III. දසපිංකිරියවත්
IV. දසකුසල්
V. දසඅකුසල්

24. දැහැමි වුත්, ශිෂ්ටසම්පන්න වුත්, මානසික තෘප්තිය යනු,

I. අල්පේච්ඡතාවයි
II. සංතෘෂ්ටියයි
III. මහිච්ඡතාවයයි
IV. අප්පකිච්ඡතාවයයි
V. සුභරතාවයි

25. වඩාත් නිවැරදි බෞද්ධ ප්‍රකාශය වන්නේ,

I. වැරදි කරන්නන්ට දඬුවම් දිය යුතුයි
II. වැරදි වලට උදවු කළ යුතුයි
III. වැරදි නොදුටු සේ යා යුතුයි
IV. වරදට සමාව දිය යුතුයි
V. වරදට පෙළඹෙන හේතු නැතිකොට අපරාධ නැති කළ යුතුයි

26). "ආරාම රෝපා - වන රෝපා" යන්නෙන් පරිසර සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම සඳහන් වන්නේ

I. දේවතා සූත්‍රයේ
II. සක්කපඤ්හ සූත්‍රයේ
III. වනරෝප සූත්‍රයේ
IV. වංගීස සූත්‍රයේ
V. ජාතක පාලියේ

27). "අගථිතො,අමුච්ඡිතෝ,අනජ්ඣාපන්නෝ,ආදීනව දස්සාවී,නිස්සරණ පඤ්ඤා" යනුවෙන් දැක්වෙන්නේ

I. ධනය ඉපයීමයි
II. ධනය පරිභෝජනයයි
III. විවේක සුවයයි
IV. ධාර්මික ප්‍රීතියයි
V. සෞන්දර්යය රසාස්වාදයයි

28). ධනය ඉපයීමේ දී නොකා නොබී ධනය ගොඩ ගසා ගන්නා හා අරපිරිමැස්මෙන් තොරව අනවශ්‍ය කටයුතු සඳහා වියදම් කරන්නා බුදු දහමේ දක්වා ඇත්තේ

I. අජද්ධුමාරික හා උදුම්බර වාදික
II. අජද්ධුමාරික හා කාකමාසික
III. උදුම්බරකාදක හා අජද්ධුමාරික
IV. උදුම්බරකාදක හා අලංසාටක
V. කාකමාසක හා අලංසාටක

29) "තුලාකූට,මානකූට,කංසකූට,උක්කෝටන,නිකති" ආදී වංචනික කටයුතු වලින් මුදල් ඉපයුම නොකළ යුතු යැයි සඳහන් වන රැකියාව

I. කෘෂිකර්මය
II. වෙළඳාම
III. සත්ව පාලනය
IV. මුදල් පොළියට දීම
V. රාජ්‍ය සේවය

30). රියසකට කඩ ඇණය මෙන් සමාජයේ යහ පැවැත්මට උපයෝගී වන්නේ

I. පංචසීලය
II. අටසීලය
III. දසසීලය
IV. සතර සංග්‍රහ වස්තු
V. සතර අගතිය

31). "බුදුරදුන් ඒක පුද්ගල,ඒකාධිපති,ඒකනායක පිළිවෙත් බැහැර කරමින් ප්‍රජාතන්ත්‍රීය පාලන ක්‍රමයක් අනුගමනය කළහ.ඒ අනුව අධිකාරි බලයක් අනුගමනය නොකළහ.ආඥාදායකයකු නොවූහ..........."මෙයින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේගේ

I. මහා ප්‍රඥාව
II. මහා කරුණාව
III. තාදී ගුණය
IV. ශාස්තෘත්වය
V. පද්මාකාර ජීවිතය

32). බුදුරදුන් නිර්වාණය,පුනර්භවය,කර්මය,මෝක්ෂය,හේතුඵලවාදය වැනි ගැඹුරු දාර්ශනික මාතෘකා ඇසුරින් බුද්ධිමත් නැණවත් ශ්‍රාවකයින් උදෙසා දහම් දේශනා කිරීමේ ක්‍රමය

I. අනුපුබ්බී කතා ක්‍රමය
II. සාමොක්කංසිකා ක්‍රමය
III. අත්තජ්ඣාස ක්‍රමය
IV. යාපනීය ක්‍රමය
V. පුජ්ඡාවාසික ක්‍රමය

33). අවසාන නිගමනයකට එළඹිය යුත්තේ තම මතයට ද අනුරූපීවය.දේවදහ,අරිය පරියේෂණ,බ්‍රහ්මජාල,මහා පරිනිබ්බාන,චංකි,මහා වේදල්ල ආදී සූත්‍ර රැසකින්ම පෙන්වා දෙන බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨ ගුණාංගය

I. මහා කරුණාව
II. තාදී ගුණය
III. පද්මාකාර ජීවිතය
IV. නායකත්වය
V. නිදහස් චින්තනය

34). "හවත්නි ශබ්ද කරන්න එපා,හෙමින් හෙමින් පා තබමින් ගෞතමයන් අසලට යා යුතුයි. බුදුවරු සිංහයන් මෙන් තනිව හැසිරෙති.ඔවුන් ළඟට යාම අමාරු කාර්යයක්.............." බුදු රදුන් පිළිබඳ මෙම ප්‍රකාශය කළ පුද්ගලයා හා දේශිත සූත්‍රය

I. සේල බමුණා - සේල සූත්‍රය
II. සෝණදණ්ඩ බමුණා - අග්ගඤ්ඤ සූත්‍රය
III. උපාලි ගෘහපති - උපාලි සූත්‍රය
IV. අභය රාජ කුමරා - චංකි සූත්‍රය
V. පොක්කරසාති බමුණා - බ්‍රහ්මජාල සූත්‍රය

35). බුද්ධ වචනය එක් රැස් කිරීම, ධර්ම විනය පිළිබඳ දුර්මත නැති කිරීම, බුද්ධ වචනය වර්ග කිරීම,ධර්ම විනය ගුරු තනතුරේ තබා ගැනීම.ආදී ප්‍රතිඵල සිදු වූයේ,

I. පංචසතිකා සංගීතියේ දී
II. සත්තසතිකා සංගීතියේ දී
III. සහස්සිකා සංගීතියේ දී
IV. පුස්තකාරූඪ සංගීතියේ දී
V. විභාෂා සංගීතියේ දී

36). බුද්ධ වචනය සුරක්ෂිත කර ගැනීමට ස්ථිරසාර ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීමට තෝරා ගත් පිළිවෙළ වූයේ මුඛ පරම්පරාවෙන් පවත්වා ගෙන යාමයි. ඒ අනුව එක්, එක් කොටස් වෙන වෙනම ගුරු කුල වලට පවරනු ලැබිණ. ඒ අනුව අංගුත්තර නිකාය භාර වූයේ,

I. අනුරුද්ධ හිමිට
II. ආනන්ද හිමිට
III. මහා කාශ්‍යප හිමිට
IV. සැරියුත් හිමිට
V. යස හිමිට

37). සර්වාස්ථිවාදී මත ඛණ්ඩනය කිරීමට කරුණු 500 ක්ද ථෙරවාදී මතය සනාථ කිරීමට කරුණු 500 ක්ද ඇතුළත් වන අයුරින් කථාවත්ථු ප්‍රකරණය රචනා කළහ.ඉන් පසු අභිධර්ම පිටකය ප්‍රකරණ 04 කින් යුක්ත විය. ඒ නිසාම අභිධර්ම පිටකය සම්පූර්ණ විය.සූත්‍ර,විනය,අභිධර්ම යනුවෙන් ත්‍රිපිටකයක් ඇති වූයේ මෙම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසයි.එම සංගායනාව

I. පළමු ධර්ම සංගායනාව
II. දෙවන ධර්ම සංගායනාව
III. තෙවන ධර්ම සංගායනාව
IV. සිවුවන ධර්ම සංගායනාව
V. විභාෂා ධර්ම සංගායනාව

38). බටහිර ඉන්දියාවේ කතියවාර් අර්ධද්වීපයේ "භවනගර්" අසල පිහිටි ප්‍රධාන හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානය වන්නේ

I. නාලන්දාව
II. වලභී
III. වික්‍රමශිලාව
IV. තක්ෂිලාව
V. ඕදන්තපුරි

39). පියදාස පියදසිලාජා දේවානම්ප්‍රිය ප්‍රියදශි යන නම්වලින් ප්‍රසිද්ධ වූ රජු

I. අජාසත් රජු
II. කණිෂ්ක රජු
III. විජය රජු
IV. දෙවන පෑතිස් රජු
V. ධර්මාශෝක රජු

40."සංගායනාවේදි සාකච්ඡා කරන ලද සූත්‍ර හා විනය ඇතුළත් කර උපදේශ ශාස්ත්‍ර විනය විභාෂා ශාස්ත්‍ර නමින් ග්‍රන්ථ 2 ක් සම්පාදනය කර, එම කෘති තඹ පත්වල ලියවා, ගල් පෙට්ටියක බහා, නිදන් කොට, මහා සෑයක් කළ බව වාර්තා වෙයි''. එම සංගායනාව හා ඊට දායක වූ රජතුමා

I. පළමු සංගායනාව - අජාසත් රජු
II. දෙවන සංගායනාව - කාලාශෝක රජු
III. තෙවන සංගායනාව - අශෝක රජු
IV. හතරවන සංගායනාව - කණිෂ්ක රජු
V. හයවන සංගායනාව - වළගම්බා රජු

41. ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස අතර දේව, යක්ෂ, නාග, වෘක්ෂ, ජෛන, පරිබ්‍රාජක ආදි ආගමික පසුබිමක් දක්නට ලැබුණි. මේ සියලු ආගම්වලට අනුග්‍රහය දැක්වූ රජතුමා

I. වළගම්බා රජු
II. පණ්ඩුකාභය රජු
III. දුටුගැමුණු රජු
IV. විජය රජු
V. කණිෂ්ක රජු

42. ඉන්දීය ගුප්ත යුගයේ නිර්මාණවල ආභාෂයෙන් ගොඩනැගිලි ඉදි කොට ඇති අතර, දෙවන පෑතිස් රාජ්‍ය සමයෙන් පසු දුටුගැමුණු රජතුමා මෙහි සංවර්ධනය සඳහා දැඩි කැප කිරීමක් කොට ඇත. නේවාසික මෙන්ම බැහැරින් පැමිණි විශාල භික්ෂුන් සමුහයක් මෙහිදි අධ්‍යාපනය සිදුකොට ඇති අතර, බුද්ධඝෝෂ, බුද්ධ දත්ත වැනි විදේශ පඬිවරුද අධ්‍යාපන කටයුතු සඳහා මෙහි පැමිණ ඇත. මෙම අධ්‍යාපන ආයතනය වන්නේ.

I. අභයගිරිය
II. නාලන්දාව
III. මහාවිහාරය
IV. තක්ෂිලාව
V. වලභි විශ්ව විද්‍යාලය

43. ක්‍රි.ව. හත්වැනි සියවසේ "ද්වාරවතී" රාජ්‍යයේ බුදුසමය සමෘද්ධිමත් ව පැවති අතර එම ද්වරවතිය වර්තමානය වන විට අයත් වන්නේ

I. ජපානයට
II. තායිලන්තයට
III. චීනයට
IV. බුරුමයට
V. ඉන්දියාවට

44. සියම් නිකාය, ධම්මයුත්තික නිකාය, හා මහා නිකාය ලෙස කොටස් 2 ක් බෙදා දැඩි විනය ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට භික්ෂූන් පෙළඹ වූ රජතුමා

I. ෂොතොකුතෙෂි
II. අනවරථ
III. මොන්කුන්
IV. බොදෝපයා
V. ධම්මචේතිය

45.මළවුන් පිදීමට බෞද්ධ අර්ථකථන සපයමින් ඇති වූ උත්සවය

I. බොන්
II. ඉකෙබෙලා
III. වා.නො.යු.
IV. ෂින්තෝ
V. දයිබුත්සු

46. බෞද්ධ භික්ෂූන් චීනයට යවා චීනයේ ප්‍රචලිත මහායාන හා හීනයාන ධර්ම ග්‍රන්ථ ආදියෙන් සිරිත් විරිත් හා සංස්කෘතිකාංගයන් අධ්‍යයනය කරමින් මහායාන සූත්‍ර ජපන් බසට නගා ව්‍යාප්ත කරමින් වෙහෙර, විහාර ගොඩනගමින් ජපන් බුදු සමයේ ස්වර්ණමය යුගය බිහි කළ පාලකයා

I. හැන්මින්දි
II. කණිෂ්ක
III. අනවරථ
IV. උමයාදෝ
V. කිම්මෙයි

47. භූගෝලීය වශයෙන් විශාල භූමි ප්‍රදේශයක විසිරි ගිය විවිධ කුල ගෝත්‍රවලට අයත් සියලු දෙනා බුදු සමයේ ආලෝකයෙන් කුලගෝත්‍ර අතර මිත්‍රශීලිව වාසය කරන " බ්‍රහ්ම දේශය " ලෙස හඳුන්වන රටක්වන්නේ

I. තායිලන්තය
II. බුරුමය
III. ජපානය
IV. චීනය
V. ඉන්දියාව

48. මහායානයට අයත් වෛතුල්‍ය වාදය, වාජරිය වාදය ඉගැන්වීම් පිළිගත් මෙම ආයතනය සඳහා ගජබා රජතුමා "ගාමිණි තිස්ස" නමින් ජලාශයක් බඳවා දි ඇත. මේ ආරාමය වන්නේ

I. මහා විහාරය
II. නාලන්දාව
III. ජේතවනය
IV. අභයගිරිය
V. තක්ෂිලාව

49. ජපානයේ සෙන් බුදු දහමේ ආභාසයෙන් ගොඩනැගුණු " ජිගකු " නම් විශේෂ ශිල්ප කලාව

I. නාට්‍ය කලාව
II. සංගීතය
III. කාව්‍ය
IV. චිත්‍ර
V. උද්‍යාන සැකසුම් කලාව

50. අනුරාධපුර නගරයේ නැගෙනහිර දිසාවේ දෙවොලක විසුවේ

I. චිත්තරාජ
II. කාලවේල
III. වෛශ්‍රවණ
IV. මහේජ
V. කාලයෝදර

**ලකුණු 2X50 = 100**